# යාලු වුණ ජිරාෆ්



තිනුලි වික්‍රමරත්න

# යාලූ වූණ පීරාන්

තිනුලි වික්‍රමරත්න

# යාලු වුණ පීරාෆ්

කතෘ ප්‍රකාශනයකි.

ප්‍රථම මුද්‍රණය 2023 නොවැම්බර්

කතෘන්ගේ වෙනත් කෘති

- අමාලියාගේ උපන්දිනය
- සිඟිති වැඩ පොත
- වලස් පැංචාට පාඩමක්
- පුංචි මගේ සිතුවිලි
- සුපුනිට තෑග්ගක්
- හද ඇල්ලූ හැටි
- සතුටින් තෝරමු
- ආඩම්බර සමනලයා

# පිදුම

මට ජීවිතය දුන් මගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්,

කුඩා කලම මා පුංචි කතුවරියක් කළ

මගේ දෙවැනි අම්මා වූ රංජනී සෙන්දනායක

ආදරණීය ගුරු මෑණියන්ටත්,

දැනට මා ඉගෙනුම ලබන **5**-A පන්තියේ

අමිතා කුමාරිහාමි ආදරණීය ගුරු මෑණියන්ටත්,

"ඔයාට පොත් ගොඩක් ලියන්න පුළුවන් තිනුලි"

කියමින් මා දිරිමත් කළ

ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්,

පරිගණක කරනයෙන් අකුරු සකසා මෙම පොත

නිම කිරීමට මා හට සහයෝගය දුන්

මගේම ආදරණීය අක්කාටත්

මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු  සතුටින් ජීවත්වන පවුලක් මෙන්මප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීණකරණය කරමින් 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. 2023 සාහිත්‍ය මාසයට සමගාමීව පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් ක්‍රියා කෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙන්ම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවයද ද ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023 .11. 01

එකෝමත් එක කාලෙක පුංචි ගම්මානයක් තිබුණා.



ඒ ගමේ හොඳම බලු යාළුවෝ දෙන්නෙක් හිටියා.



ඒ දෙන්නා සින්දු සහ බිංදු.


දවසක් දා  මෙයාලා 'සෙල්ලමක් කරමු'  කියලා  කතා වුණා. ඊට පස්සේ සිංදු ට මතක් උනා එයාගේ ගෙදර බෝලයක් තියෙනවා කියලා.




බිංදු කිව්වා 'එහෙනම් ඔයා බෝලෙ ගේන්න, අපි බෝලෙන් සෙල්ලම් කරමු' කියලා. ඊට පස්සේ සිංදු ගිහින් බෝලයක් ගෙනාවා. දෙන්නා බෝලෙත් එක්ක සෙල්ලම් කර කර හිටියේ තාප්පෙකට පිටිපස්සේ.



ඉතින් ඒ තාප්පෙට එහා පැත්තේ හිටියේ ජිරාෆ් කෙනෙක්. ඒ ජිරාෆ් කොළඅතු කන්න හරි ආසයි.



මේ යාළුවෝ දෙන්නා සෙල්ලම් කර කර ඉන්නකොට බෝලේ තාප්පෙන් එළියට ගියා.



ඉතින් මේ බලු යාළුවෝ දෙන්නා ජිරාෆ්ට කිව්වා, 'අනේ අපිට බෝලය අරං දෙන්නකෝ' කියලා. ජිරාෆ් කිව්වා, 'මට බෑ ඔයාලට ඕන නම් ගන්න' කියලා.



ඊට පස්සේ, සිංදුයි බිංදුයි හොඳට කල්පනා කරලා බැලුවා. සින්දුට පොඩි අදහසක් ආවා.



සිංදු බිංදුට කිව්වා, 'අපි ජිරාෆ්ට කොළ අතු දීලා, අපි අපේ බෝලය ඉල්ලා ගමු. එතකොට එයා අපිත් එක්කත් යාලු වෙනවනේ.' සිංදුයි බිංදුයි ජිරාෆ් ළඟට කොළ අතු ටික දුන්නා. ජිරාෆ්ට හුගක් දුක හිතුනා. ඊට පස්සේ ජිරාෆ් එයාලගේ බෝලය තාප්පෙන් එහාපැත්තට දැම්මා.



ඊට පස්සේ ජිරාෆ් බලු යාලුවො දෙන්නත් එක්ක හැමදාම සතුටින් සෙල්ලම් කළා.



# නිමි !



# පසුවදන

පසුවදන නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවත් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතික නව මාවතකට යොමු කරමින් පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මේ විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනනගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට
සෙනවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 .11. 01